# 20

# අපි වෙමු එක මවකගෙ දරුවෝ

"දිවි මගෙහි පෙර ගමනට  පෙර පෝද දහම් අරුණ"යන්න ලොකු අකුරෙන් ලියූ විශාල බැනරයක් විදුහලේ ප්‍රධාන ශාලාවේ වේදිකා පුවරුවේ දක්නට ලැබිණි. එය අප විදුහලේ උසස් පෙළ සොයුරු සොයුරියන් ඇසළ පෝයට පෙර ද සූදනම් කළ වැඩසටහනකි. පාසලෙහි බෞද්ධ සොයුරු සොයුරියන් පෙහෙවස් සමාදන් වී දහවල දනය පිළිගැනීමට සූදනම් ව සිටිනු පෙනිණි. දනය රැගෙන ඒම, පිළිගැන්වීම හා සියලු වතාවත්, උපස්ථාන සිදු කරමින් ඉතා උනන්දුවෙන් කටයුතු කෙළේ අන්‍යාගමික සොයුරු සොයුරියන් ය. මෙය දුටු අසිතට සිතේ සතුටක් ඉපැදිණි. රැකියාවකට යාමට පෙර තමා උගත් පාසලේ ගුරු මවුපිය පා නැමැඳ ආශිර්වාද ලබා ගැනීමට එදින පාසල වෙත පිය නැඟූ අසිතට සිහි වූයේ පසුගිය වර්ෂයේ අන්‍යාගමික සහෝදරත්වය වෙනුවෙන් පාසලේ ධර්මාචාර්ය ස්වාමීන් වහන්සේ ඉටු කළ සාමයික සහජීවන වැඩසටහනයි. එහි දී බෞද්ධ සොයුරු සොයුරියන්, සියලු කටයුතුවල යෙදී සිටියේ ද ඉතා ගෞරවයෙනි. එම වැඩසටහන නිමිති කොට සැකසූ සමරු සංග්‍රහය යළිත් බැලීමට අසිතට සිත් විය. ඔහු වහා පාසලේ පුස්තකාලය වෙත ගොස් සමරු සංග්‍රහය ලබා ගෙන ඉතා උද්යෝගයෙන් පිටුවෙන් පිටුව කියවන්නට විය. විදුහල්පතිතුමා සපයා තිබූ ලිපියට ඔහු අවධානය යොමු කරමින් සිටියේ මා එහි යනවිට ය. මා දුටු හෙතෙම මට අතින් සංඥාවක් කොට මා ද එතැනට කැඳවා ඔහු බලමින් සිටි ලිපිය දෙසට ඇඟිල්ලක් යොමු කර මට ද එය බලන ලෙස ඉඟි කෙළේ ය. අපි දෙදෙනා ම එම ලිපිය බැලුවෙමු. එහි මෙසේ සටහන් වී තිබිණි.

"මා උපතින් බෞද්ධයකු නො වූව ද පාසලේ දී මම බුදුදහම ඉගෙන ගතිමි. විශ්ව විද්‍යාලයයේ පුස්තකාලයෙහි දී මම බොහෝ විට බෞද්ධ පොත් පත් සඟරා ආදිය කියවීමි. බුදුරජාණන් වහන්සේගේ චරිතය ඇසුරෙන් මට දක ගත හැකි වූ විශේෂ ලක්ෂණයක් විය. අන්‍ය ආගමික ශාස්තෘවරුන් හා අන්‍ය ආගමික ශ්‍රාවකයන් සොයා උන් වහන්සේ වැඩම කර තිබිණි. උපාලි නම් ගෘහපතියකු බුදුරජාණන් වහන්සේ මුණ ගැසිණි. ඔහු අන්‍ය ආගමිකයෙකි. පසුව තුනුරුවන් සරණ ගොස් තමා මින් මතුවට උපාසකයකු කොට සලකන ලෙස හෙතෙම බුදුරජාණන් වහන්සේගෙන් අයැද සිටියේ ය. එවිට බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබුණේ ඔහුගේ පැරණි ශාස්තෘවරයාණන්ට කළ ගරු සැලකිලි අඩු නො කරන ලෙස ය. මෙය මා සිත් ගත් සිදුවීමකි. එසේ ම බුදුරජාණන් වහන්සේ වේළුද්වාර නම් සූත්‍ර දේශනාවක දී තමන් මුල් කොට සෙසු අය දෙස බලන ලෙස උගන්වා තිබිණි. මේ අනුව තමන්ට අප්‍රිය දේ අනුන්ට ද අප්‍රිය බවත්, අසමගිය දනවන දේ තමාට අප්‍රිය නම් අනුන්ට  ද ඒවා අප්‍රිය බවත් දැන කටයුතු කිරීමට උපදෙස් දී තිබිණි.

බෞද්ධ ජන සමාජය සැමට සේවය කරමින් ආදර්ශ සම්පන්න වීමට හේතුව මෙම ඉගැන්වීම් බව මට සිතේ. කුලභේදයේ කුලවාදයේ ඇති නිරර්ථක බව දක්වීමට බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති වාසෙට්ඨ සූත්‍රය ද මට කිසි ද අමතක නො වේ. කුල වශයෙන්, පන්ති වශයෙන්, ජාති, ආගම් වශයෙන් මිනිසා උසස් පහත් නො වන බව සලකා සමානාත්මතාවෙන් යුතු ව බෞද්ධ සහෝදරයන් කටයුතු කරන්නේ බුදු දහමේ එන ඉගැන්වීම් නිසා ය.



එක මවකගෙ දරු කැළ ලෙසිනා

බෙදහද ගැනීම පිළිබඳ බෞද්ධ ජනතාව අතර ඇත්තේ ලෝකයේ මා දුටු කිසිදු ජනතාවක් අතර නැති තරමේ පුහුණුවකි. දෙදහස් හතර වර්ෂයේ දී ලොව ම කම්පා කළ අප රටට ද බලපෑ සුනාමි ව්‍යසනයේ දී අප රටේ බෞද්ධයන් කටයුතු කළ ආකාරය ඉතාමත් ම ප්‍රශංසනීයයි. කිසිදු ආගම්, ජාති, කුල භේදයකින් තොරව සැමට ජීවත් වීමට හැකි සියලු දේ ඔවුහු ලබා දුන්හ. ලෝක ජන නායකයන් පවා මේ පිළිබඳ ව විස්මය පළ කර ඇත.

සම්පත් ගොඩ ගසා තනි ව භුක්ති නොවිඳ දනය පාරමිතාවක් සේ හුරු පුරුදු කරන බෞද්ධයෝ මහා දන්සල් පවත්වති. වෙසක්, පොසොන්, ඇසළ ආදී මාසයන්හි පොහෝ දිනවල මුළු රට ම දන්සලක් බවට පත් වන්නේ අසිරිමත් ආකාරයෙනි. දන්සල ඕනෑ ම ජාතිකයකුට, ඕනෑම ආගමිකයකුට විවෘත වූවකි. එහි උස් පහත් භේදයක් ද නැත. විශේෂිත කාමර, විශේෂ කෑම මේස පිළියෙල නො වන්නේ බෞද්ධයන් ගරුකොට සලකන සමානාත්මතා ප්‍රතිපත්තිය නිසා යැයි මට සිතේ. බුදුරජාණන් වහන්සේ ද

කුසගින්නේ පැමිණි ගොවියකුට තම පාත්‍රයෙන් දන් දුන් බවක් සහ තමන්ට පිරිකර ලෙස ලැබුණු සිවුරු ගොඩ ගසා සිටි උපනන්ද නම් භික්ෂු නමකට එසේ විශාල පිරිකර ප්‍රමාණයක් තනි ව පරිහරණය කිරීමේ ආදීනව පැහැදිලි කර දුන් බවත් මම අසා ඇත්තෙමි. මේ ආභාසය වර්තමාන බෞද්ධ ජනතාව තුළ ද තිබීමෙන් අපේ ලාංකීය සමාජය තුළ සහජීවනය ගොඩ නැඟෙන අයුරු මම අත් දැක ඇත්තෙමි.

"පිංතාලිය" මා මේ රටේ දුටු උතුම් සමාජ සත්කාරක සේවයකි. පිපාසයට දිය පොදක් දෙන්නට ඇති කළ පිංතාලිය මෙන් ම ගිමන් හරින්නට මගී අයිතියට පවරා දුන් "අම්බලම" ද සමගියේ, සහජීවනයේ ජීවමාන සංකේතයන් ය. වන වගා, පලතුරු උයන්, මං මාවත්, පැන් පොකුණු තැනීම දිවා රෑ පිං වැඩෙන ක්‍රියා ලෙස බුදු දහමේ කළ ඉගැන්වීම් ඒවාට බලපා ඇත. මේ සියල්ල සියල්ලන් සඳහා වීම සුවිශේෂ කරුණකි. විවිධ මතිමතාන්තර ඇති සමාජයක් තුළ බුද්ධිමත් තීරණයන්ට එළැඹීමේ හැකියාව, සමගිය සහ සහජීවනය වර්ධනයට අත්‍යවශ්‍ය ය. තමන්ගේ ම මතය උසස් බවත් සෙසු මත පහත් බවත් දැක්වීමෙන් ගොඩ නැඟෙන්නේ ගැටුමකි. එබඳු අවාසනාවන්ත තත්ත්ව ඇති නො වීමට බුදු දහමෙන් විශිෂ්ට මග පෙන්වීමක් කර ඇත.




**කාටත් විවෘතයි.**

කෝලිය නගරය සහ කපිලවස්තු පුරය අතරින් ගලා ගිය රමණීය රෝහිණී නදියේ ජලය බෙදා ගැනීම පිළිබඳ විවාදය, අවි ගැටුමක් බවට පත් වීම වැළැක්වූ බුදුරජාණන් වහන්සේ සමගිය, සාමය ගොඩනැගීමට ගත් උත්සාහය බෞද්ධයෝ නිතර සිහි කරති.

ඒ අනුව ජීවත් වීමට සැලසුම් කරති. එසේ ම කායික, වාචසික, මානසික ක්‍රියාකාරකම් මෛත්‍රී සහගත ව පවත්වා ගැනීමට බුදු දහමින් කෙරෙන ඉගැන්වීම සමාජ සහජීවනයට බලවත් උපකාරයකි. දීඝිති කෝසල ජාතක කථාව වෛරයෙන් මිදීම සඳහා ලැබෙන විශිෂ්ට ආදර්ශයකි.

අනෙකුත් ආගම්වලට ලංකාවේ පැතිර යෑමට ඉඩ ලැබුණේ බෞද්ධයන් එම ආගමිකයන්ට බාධා නො කර ඒ ආගමික ඉගැන්වීම්වලට ද ගරු කරමින් සහජීවන ප්‍රතිපත්තියක් අනුගමනය කළ නිසා ය, යන්න මගේ හැඟීමයි. ශ්‍රේෂ්ඨ බෞද්ධ රජකු වූ ධර්මාශෝක අධිරාජයා විසින් කර ඇති 'අන්‍යාගම්වලට නිගරු කරන්නා තම ආගමට නිගරු කරන්නෙකි' යන ශ්‍රේෂ්ඨ ප්‍රකාශය ද ශ්‍රී ලාංකික ජන සමාජයේ සමගියට හා සහජීවනයට බලපා ඇතැයි මට සිතේ.

බෞද්ධ ජනතාව තම ශාස්තෘවරයාගේ චරිතයෙන් මනා ආදර්ශයක් ලබා ගනිමින් එම දහම අනුව කටයුතු කිරීම නිසා සියලු දෙනාට ම සහජීවනයෙන් විසීමට හැකියාව ලැබී ඇත."

විදුහල්පතිතුමාගේ ලිපිය අප ද අලුතින් සිතීමට පොලඹවන්නක් විය. එය කියවීමෙන් පසු ව පුස්තකාලයෙන් පිට වූ අප දෙදෙනා සාකච්ඡා කෙළේ අපේ ආදි ශිෂ්‍ය සංගමය මේ වසරේ පැවැත්වීමට නියමිත "සහජීවනය උදෙසා ශ්‍රමදන" වැඩසටහන ඉතා ඉහළින් සාර්ථක කර ගැනීමට ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව ය.

**සාරාංශය**

බුදු දහම සහජීවනය, සාමය, සමගිය නිරතුරුව අගයයි. අප ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ඒ පිළිබඳ බොහෝ ක්‍රියාකාරී අවස්ථා දැකිය හැකි ය. විවිධ සූත්‍ර දේශනා තුළින් මේ සඳහා උපදෙස් සපයන බුදු දහම ගුරු කොට ගත් ශ්‍රී ලාංකීය ජනතාව අතීතයේ සිට මේ දක්වා සමගිය සාමය ගොඩ නඟා සහජීවනයට හුරු වූ අයුරු, විවිධ අවස්ථා හා ක්‍රියාකාරකම් තුළින් දැකිය හැකි ය.

## ක්‍රියාකාරකම්

01. සහජීවනය, සමගිය උදෙසා අප තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග කිහිපයක් දක්වන්න.

02. මිනිසුන් සහජීවනයෙන් ක්‍රියා කළ අවස්ථාවක් ඔබගේ අත්දැකීමක් ඇසුරෙන් විස්තර කරන්න.

## පැවරුම

දීඝිති කෝසල ජාතකය කියවා එය සාමයට මග කියා දෙන ආකාරය පෙන්වා දෙමින් රචනයක් ලියන්න.

## පුහුණුවට

**සාමග්ගිමේව සික්ඛේථ**
**බුද්ධේහේතං පසංසිතං**

සමගියෙහි ම හික්මෙව්
මෙය බුදුවරයන් විසින් පසස්නා ලදී.

**එන්දන ජාතකය**